**රබර් පාලන අරමුදල - 2016**
**---------------------------------**

රබර් පාලන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (අ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**---------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**
**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය ව්‍යාවනය**
**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය .ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද රු. 1,864,559 ක් රබර් පාලන අරමුදලෙන් අඩු කර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 635,271 ක් වූ ජංගම වත්කම් 13 ක ශේෂ වර්ෂ 19 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවති අතර, ඊට ඇතුළත් රු.287,378 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු. 239,784 ක් වූ ජංගම බැරකම් විෂයයන් 05 ක ශේෂ වර්ෂ 19 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබූ අතර, ඊට ඇතුළත් රු.222,031 ක ගෙවිය යුතු අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 | - සත්‍යාපන වාර්තා<br>- ස්ථාවර වත්කම් ලේඛන |
| (ආ) | ජංගම වත්කම් | 635,271 | - උපලේඛන<br>- කාල විශ්ලේෂණ<br>- ශේෂ සනාථන |
| (ඇ) | ජංගම බැරකම් | 239,784 | - උපලේඛන<br>- කාල විශ්ලේෂණ<br>- ශේෂ සනාථන |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය**

2009 ජූලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී අරමුදල ඇවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දින දීය. 2016 මාර්තු 09 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඇවරකරුවකු පත්කර තිබුණද ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදකගේ සහය ඇතිව අරමුදලේ කටයුතු ඇවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් 2017 ජූනි 30 වන විටත් පිළියෙළ කර නොතිබුණි.

අරමුදල අවසන් වරට ක්‍රියාකාරි මට්ටමේ පැවති 1997 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ශේෂ පත්‍රයේ සිට සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රය තෙක් ඉදිරියට ගෙනවිත් තිබුණු වත්කම් හා වගකීම් තවදුරටත් නිරවුල් කළ නොහැකි වත්කම් හා වගකීම් ලෙස හඳුනාගත හැකි විය. එම කිසිදු වත්කමක් සම්බන්ධයෙන් උපලේඛනයක් හෝ එම වත්කම් භෞතිකව පවතින බවට තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එහි දක්වා තිබූ වගකීම් වලට අදාලව ඒවාට හිමිකම් ඇති ඇතැම් ආයතන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පැවතියද ඒ සඳහා ඔවුන් ඉදිරිපත් නොවන තත්ත්වයක් නිරීක්ෂණය වන අතර ඇතැම් ආයතන දැනට ක්‍රියාත්මකව නොපැවතුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ඇවර කිරීමට යටත්වන වත්කම් හා වගකීම් සත්‍ය හා සාධාරණ ලෙස නිරූපනය වන ගිණුම් අයිතමයන් නොවීය.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2016 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද අරමුදලේ මූල්‍ය ප්‍රකාශන, දින 107 ක් ප්‍රමාද වී 2017 ජුනි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු/ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.